සමාජ සවිබලගැන්වීම හා සුභසාධන අමාත්‍යාංශය
சமூகவலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4ஆம் மாடி செத்சிறிபாய பத்தரமுல்ல
4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனது இல / My No: DDD/HO/MF/05/01/ ප්‍රජාමූල සංවිධාන
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2015/12 - 31

සියළුම දිවිනැගුම ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති,

කළමණාකරුවන් වෙත,

## දිවිනැගුම ප්‍රජාමූල බැංකු පාලක මණ්ඩල හා දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති විධායක කමිටු පත් කිරීම - 2016

දිවිනැගුම වැඩසටහන යටතේ දිවිනැගුම ප්‍රජාමූල සංවිධාන පිහිටුවීම හා නිලවරණ පැවැත්වීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්ගේ, DDD/HO/09/CBO/ප්‍ර.සං/පොදු අංක දරණ 2015/12/02 දිනැති ලිපිය මගින් දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් හා දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන් වෙත උපදෙස් ලබාදී ඇත.

එම ලිපියේ සඳහන් පරිදි, දිවිනැගුම ප්‍රජාමූල සංවිධාන පිහිටුවීම හා නිලධාරීන් පත්කිරීම සිදු කිරීමෙන් අනතුරුව, දිවිනැගුම ප්‍රජාමූල බැංකු සඳහා පාලක මණ්ඩල හා දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති වලට විධායක කමිටු පත්කර ගැනීම සඳහා මහසභා රැස්වීම පැවැත්වීමට අවශ්‍ය කටයුතු සංවිධානය කල යුතුය.

බැංකු පාලක මණ්ඩල හා බැංකු සමිති විධායක කමිටු පත් කිරීම සඳහා නියමයන් ඇතුලත් නව ව්‍යවස්ථාවන් දැනට සකස් කරමින් පවතින අතර, එම කාර්යය නිම කිරීමෙන් අනතුරුව ඔබ වෙත කඩිනමින් එවන බව දන්වමි. එනෙක්, දැනට ක්‍රියාත්මක ව්‍යවස්ථාවන් අනුව 2016 වර්ෂය සඳහා පාලක මණ්ඩල/ විධායක කමිටු පත් කිරීම සිදු කිරීමට තව දුරටත් දන්වමි.

දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති සඳහා පාලක මණ්ඩල/ විධායක කමිටු පත් කිරීමට අදාල මහ සභා රැස්වීම සංවිධානයේදී පහත පරිදි බැංකු අරමුදලින් සංග්‍රහ කටයුතු ඇතුළු වෙනත් වියදම් දැරීමට අනුමැතිය ලබාදෙමු. මෙහිදී සියළුම බැංකු සඳහා උපරිම මුදලක් සඳහන් කලද, ඔබ බැංකු/ බැංකු සමිතිවල ක්‍රියාත්මක ප්‍රජාමූල සංවිධාන සංඛ්‍යාව අනුව, වඩාත් සකසුරුවමින් අරමුදල් භාවිතා කිරීමට ඉටා ගත යුතුය.

- දිවිනැගුම ප්‍රජාමූල බැංකු සඳහා උපරිම රු.35,000
- දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති සඳහා

(1) දිවිනැගුම ප්‍රජාමූල බැංකු 3ට වඩා අඩු - උපරිම රු.15,000

(2) දිවිනැගුම ප්‍රජාමූල බැංකු 4-06 අතර උපරිම රු.30,000

(3) දිවිනැගුම ප්‍රජාමූල බැංකු 07ට වැඩි වන අවස්ථාවක උපරිම රු.50,000

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General
Tel:011-2873802/2872202
Fax -011-2889002
dg@divineguma.gov.lk

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிகபணிப்பாளர்நாயகம் / Additional DirectorGeneral
011-2871672
011-2871672
adg@divineguma.gov.lk

අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர்(நிர்வாகம்) / Director (Administration)
011-2873799
011-2873996
diradmin@divineguma.gov.lk

ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant
011-2869742
011-2869742
finance@divineguma.gov.lk

කාර්යාලය / அலுவலகம் / Office
011-2887280
**011- 2887722(Hotline)**
Isuri-desktop-Anura sir ප්‍රජාමූල සංවිධා

වියදම් දැරීමේදී, මූල්‍ය විනිවිදභාවය සුරකෙන පරිදි සිදු කල යුතු අතර, මෙමකාර්යය 2016.02.15 දිනට පෙර සිදු කර අවසන් කරන ලෙසත් දන්වා සිටිමු.

මෙම කාර්යය සාර්ථකව සිදු කිරීමට පුමුඛත්වය දක්වන ලෙසත්, මේ සම්බන්ධ ඔබ දක්වන කැපවීම අගය කොට සලකමු.

චන්ද්‍රා වික්‍රමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

ඩී.ඒ.සුනන්දා පියසිලි,
අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)

පිටපත් :- 01. ගරු අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් - කා.දැ.ස.
02. ලේකම්, සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය - කා.දැ.ස.
03. සියළුම දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් - කා.දැ.ස.
04. සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස.
05. අධ්‍යක්ෂ ප්‍රජාමූල සංවිධාන අංශය, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ස.
06. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ස.